# පූස් හාමු



ශනෙල් බිනොලි දසනායක

*කෘතියේ නම*

# පූස් හාමු

*කතෘගේ නම*

## ශනෙල් බිනොලි දසනායක



***කතෘ අයිතිය ඇතුළු විස්තර***

ශනෙල් බිනොලි දසනායක

***කතෘගේ වෙනත් කෘති*** -

පළමු දිගහැරීම

පාසල

මහාමායා බාලිකා විදුහල මහනුවර

2 ශ්‍රේණිය

***කෘතිය පළකරන දින***

08.02.2025

ISBN-978-624-208-627-9

# පිදුම

කතන්දර කියන මගේ අම්මට

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“පෙරණගත්කරණි”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පූස් හාමු

## ඉස්කොලේ අත්තාම්මට හිටියා ලස්සන පූසෙක්



කලුයි ,අලුයි එකතු වෙලා හැදුණු ලස්සන ලෝම පිරුණු පූසෙක්....

දිලිහෙන ලෝම, නිල්පාට ඇස් ජිල් බොල දෙකක් වගේ දිලිහෙනවා.

එයා කන්නේ මාළු විතරයි............

නිදාගන්නෙ අත්තාම්මගෙ සැප පුටුවේ විතරයි ........

ඒක නිසා හැමෝම එයාට කිව්වේ පූස් හාමු කියලා .

හාමු මීයෝ අල්ලන්නේ නෑ.
කැරපොත්තො දැක්කේ නෑ
වගේ ඉන්නේ .

ඇයි ඉතින් හාමුට බඩගිනි
නෑනේ....

අත්තාම්මා අලුත් මාළු රසට උයලා
දෙනවානේ කන්න.



එක දවසක් මාළු ගෙන වාහනය අවා.

අත්තාම්ම ගියා මාළු ගන්න

හාමු ලගට වෙලා හිටියා.

එකපාරටම හැමෝම කෑගහන්න පටන්ගත්තා .

බලද්දි හාමු ලොකු මාළු කුරියෙක්
ඇරගෙන පැනලා යනවා.

මාළු මාමා ළඟ තිබ්බ කොස්ස
අරගෙන හාමු පස්සෙ පන්නනවා.

ලොකු මාළු කුරියෙක් ....

කොහොම හරි කට්ටිය එකතු
වෙලා හාමුගෙන් මාළු කුරියව
බේරාගත්තා.

අම්මෝ  යන්නත් බෑරුනා .....

නැත්තං ඔය මාළු වලට මම එපැයැ ගෙවන්න......

ආත්තම්මා හාමුට පුංචි ගුටියක් දෙන ගමන් කීවා .

කන්න දෙනවනේ හොරෙන්
කන්න හොදනෑ .................

හාමුට කරපු වැඩේ වැරදි කියලා
තේරුනාද මන්දා.....

අත්තම්මා ගාවට ඇවිත් බොහොම
බයෙන් පුරු පුරු ගෑවා.

# හැමෝටම හීනා.................



හොරකම් කරන්න හොද නෑ

දෙයක් නැත්නම් නැති විදියට
ඉන්න පුරුදු වෙන්න.

ඒ වගේම ලද දෙයින් සතුටු
වෙන්න ඉගෙන ගන්න.

තව ....බෙදාහදා ගන්නත් අමතක
කරන්න එපා.

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

# ස්තුතිය

මට පුංචි කතන්දරයක් කෘතියක් බවට පත් කරන්න අවස්ථාව ලබා දුන් මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත් , ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්, මට අකුරු ඉගැන්වූ ආදරණීය පංති භාර ගුරුතුමියටත්, අනෙකුත් ගුරු මව්වරුන්ටත්, ගුරු පියවරුන්ටත්, මගේ පවුලේ සියලු දේනාටමත් මට කතන්දරයක් ලියන්න හේතුවුන පුංචි සිද්ධියේ අයිතිකරුවන් වන ඉස්කොලේ අත්තම්මා හා පුස් හාමුටත් මගේ හෘදයාංගම ස්තුතිය පුදකරමි.



